


**මෙම සමාගමේ  කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල පවතින පහත සඳහන් තනතුරෙහි පුරප්පාඩුව  පිරවීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## කාර්මික ශිල්පි (ටින්කර්/පැස්සුම්)11වන ශ්‍රේණිය

**රැකියාවේ ස්වභාවය :** අධික්ෂණ නිළධාරින්ගේ අධික්ෂණය යටතේ සියළුම සැහැල්ලු වාහන බර වාහන සහ අනෙකුත් යාන්ත්‍රික උපකරණ වලට අවශ්‍ය ටින්කරින් හා පැස්සුම් කටයුතු සිදු කොට අලුත්වැඩියාවන් සිදු කිරීම.

**රැකියාවේ වගකීම් :**

1 ස්වාභාවික තත්ත්වයන් යටතේ වාහන වල හා අනෙකුත් උපරකරණ වල සිදුවන දිරැම් හා අනතුරු නිසා සිදුවන හානි ටින්කරින් කර පෙර තිබූ පරිදි අලුත් වැඩියා කර තීන්ත අලේපනය සඳහා සකස් කිරීම.

11 අවශ්‍ය වූ විට වාහන වල වින්ඩ්ස්ක්‍රීන් සහ වීදුරු ගලවා අවශ්‍ය අලුත්වැඩියා කටයුතු කර නැවත සවිකිරීම හා කැඩුනු ඒවා  සඳහා අලුත් වින්ඩ්ස්ක්‍රීන් සවි කිරීම.

111 වාහන හෝ උපකරණ ටින්කරින් කරීමේදී ඒවායේ ඇති උපාංග වලට හානි නොවන පරිදි අලුත් වැඩියා කටයුතු සිදු කිරීම හා එම උපාංග අවශ්‍ය වූ විට ආරක්ෂා සහිතව ගලවා සවි කිරීම.

1V අවශ්‍ය වූ විට වාහන වල ඇති සියළුම රබර් බිඩින් ආරක්ෂා සහිතව ගැලවීම හා සවි කිරීම.

V වාහන වල ඇති සියළුම ලොක් අවශ්‍ය විටෙක අලුත් වැඩියා කිරීම හා සවි කිරීම.

VI වාහන වල සයිලන්සර් ගැලවීම, අලුත් වැඩියා කිරීම හා සවි කිරීම.

VII සියළුම පිරිසැකසුම් හා අනෙකුත් පැස්සුම් කටයුතු සඳහා සහභාගි වීම.

VIII හදිසි අපදාකාරි අවස්ථාවන් වලදී ගුවන් තොටුපොලෙහි නඩත්තු කටයුතු සඳහා ක්‍රියාකාරිව සහභාගි වීම.

02/-

**සුදුසුකම් :**

(අ) ජාතික ආධුනිකත්ව මණ්ඩලයෙන්/ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියෙන් නිකුත් කරනු ලැබූ ටින්කර්/පැස්සුම් ක්ෂේත්‍රයේ දැවුරුද්දකට (02)නොඅඩු පූර්ණ කාලීන පාඨමාලා සහතිකයක් හෝ දැවුරුද්දකට (02) නොඅඩු පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් අනතුරුව කාර්මික විද්‍යාලයක් මගින් නිකුත් කරනු ලැබූ වෘත්තීය ආධුනිකත්ව සහතිකයක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබීම.

**හෝ**

ජාතික වෘත්තිය සුදුසුකම් 4 වන මට්ටම (NVQ Level 4) වෘත්තිය සහතකයක් ටින්කර්/ පැස්සුම් ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**සහ**

(ආ) ආධුනිකත්ව කාලසීමාවද/පාඨමාලා කාල සීමාවද ඇතුලත්ව සිව් (04) වසරක පළපුරුද්දක් අදාළ ක්ෂේත්‍රයෙන් ලබා තිබිම.

**වයස :**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන විට අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

**වැටුප :**

තෝරාගනු ලබන්නන්හට සියළු දීමනා සහිත ආකර්ෂණීය වැටුපක් හා ප්‍රතිලාභ රැසක් හිමිවේ.

**බඳවා ගැනීමේ ක්‍රමය:** ප්‍රායෝගික පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

**පොදු කරුණු :**

ඉහත තනතුර සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ පිහිටි ඕනෑම ගුවන් තොටුපොලක අවශ්‍ය වූ විට සේවය කල යුතුවේ.

ඉහත සුදුසුකම් හා සේවා පළපුරුද්ද ලබා තිබේ නම් මෙම වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කල අයදුම්පතක් පහත සඳහන් ලිපිනයට 2023 **ඔක්තෝබර් මස 18 වන දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවා මගින් පමණක්** ඉදිරිපත් කළ යුතුවේ. අයදුම්පත් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ **කාර්මික ශිල්පී (ටින්කර්/ පැස්සුම්) II වන ශ්‍රේණිය** යන තනතුර සඳහන් කළ යුතුවේ.

තෝරා ගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම සුදුසුකම්ලත් අයදුම්කරුවන්ට පමණක් දැනුම් දෙනු ලැබේ.

පාඨමාලා සහතික හා සේවා සහතික සහ අදාළ සහතිකවල ජායා පිටපත් සමග ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ අපගේ වෙබ් අඩවියේ ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති**
**එයාර්පෝර්ට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (ප්‍රයිවට්) ලිමිටඩ්**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල**
**කටුනායක**

Date :05/10/2023